09 පාඩම

# විනය - අවිනිශ්චිත විනිශ්චය

සංඝාදිසේසුද්දේසයෙන් අනතුරුව උදෙසනුයේ අනියත ශික්ෂාද්වයයි. අනියත යනු අවිනිශ්චිත, ස්ථිර වශයෙන් නොදත් යන අරුත් ප්‍රකට කරයි. අනියත ශික්ෂා දෙකකි. එනම් ආපත්තිය පිළිබඳ නිශ්චයක් නැති වැරදි සම්බන්ධ ශික්ෂාපද දෙකකි. මේ ආපත්ති සිදුවන්නේ භික්ෂුවක් මාගමක් සමග හුදකලාව සිටීමෙන් පාරාජිකා, සංඝාදිසේස හා පාචිත්තිය යන ඇවැත් තුනින් එකකින් චෝදනා ලැබීම අනුව ය. පළමු ශික්ෂාවට අනුව මෛථුනයට යෝග්‍ය ස්ථානයක මාගමක හා හුදකලා වීමෙනුත්, දෙවන ශික්ෂාවට අනුව මෛථුනයට අවකාශ නැති තැනෙක මාගමක හා හුදකලා වීමෙනුත් චෝදනාවට ලක්වීමට ඉඩ තිබේ. මේ ශික්ෂා අනුව චෝදනා කළ හැක්කේ ඇදහිය හැකි වදන් ඇති උවසියකට පමණි. එනම් දිට්ඨප්පත්ත, විඤ්ඤාත සාසන වශයෙන් ගත හැකි සම්‍යක් දෘෂ්ටික, සසුන හඳුනන උවසියකට පමණි. එවැන්නියක් බොරු චෝදනා කිරීමට නො පෙළඹෙන බැවිනි. ඒ උවැසිය චෝදනා කරන ඇවත පාරාජිකා වේවා, සංඝාදිසේස වේවා, පාචිත්තිය වේවා ඒ කවර ඇවතකින් නමුත් භික්ෂුවට චෝදනා කළ යුත්තේ උන්වහන්සේ පත්වූයේ යයි පිළිගන්නා ඇවතකින් පමණි. 'අනියත' යන ව්‍යවහාරය කරන්නේ එහෙයිනි. කිසියම් සිද්ධියක දී භික්ෂුවකට පාරාජිකාදී ඇවතකින් චෝදනා කරන විට ඒ භික්ෂුව ඒ චෝදනා කරන ඇවත නොපිළිගනී නම් එම ඇවතින් චෝදනාව පැවරිය නො හැකි ය. එහි දී ඒ භික්ෂුව පිළිගන්නා ඇවතක් පැවරිය යුතු වෙයි. එබඳු අවස්ථා අනියත නම් වෙයි.

## ප්‍රථම අනියත ශික්ෂා පදය

**යො පන භික්ඛු මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො පටිච්ඡන්නෙ ආසනෙ අලං කම්මනියෙ නිසජ්ජං කප්පෙය්‍ය, තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා නිසජ්ජං භික්ඛු පටිජානමානො තිණ්ණං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො පාරාජිකෙන වා සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයං ධම්මො අනියතො.**

පදාර්ථය:-

යම්කිසි භික්ෂුවක් ස්ත්‍රියක සමග හුදෙකලා ව රහසිගත ව ආවරණය වූ මෛවුන්දමට යෝග්‍ය වූ අසුනක හිඳී ද ඇදහිය යුතු බස් ඇති උපාසිකාවක් එසේ හිඳින භික්ෂුව දැක පාරාජික, සංඝාදිසෙස, පාචිත්තිය යන ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන් යම් ආපත්තියකින් චෝදනා කරයි ද, තමන් එසේ හුන් බව භික්ෂුව පිළිගන්නේ නම් පාරාජිකා, සංඝාදිසෙස,

පාචිත්තිය යන ත්‍රිවිධ ආපත්තීන් අතුරෙන්, ඇදහිය යුතු බස් ඇති උපාසිකාව චෝදනා කරන ඇවතින් භික්ෂුවට ක්‍රියා කරවිය යුතු ය. මේ අනියත ඇවතයි.

**විවරණය:-**

**මාතුගාමෙන:-**

මාගම යනු ස්ත්‍රියයි. මෙහි දි මනුස්ස නොවන යක්ෂ, ප්‍රේත, තිරශ්චීන ආදී මනුෂ්‍ය නොවන ස්ත්‍රිය අනියත සඳහා වලංගු නොවෙයි.

**රහො:-**

යනු බාහිර කිසිවෙකුට නොපෙනෙන පරිදි අප්‍රකටව සිටීමයි.

**අලං:-**

යනු සුදුසු යන අර්ථයි.

**කම්මනියං:-**

යනු මෙවුන්දම් කර්මයට යෝග්‍ය වූ යන අර්ථයයි.

**නිසජ්ජං කප්පෙය්‍ය:-**

මෙහි දී හිඳීම හෝ සයනය කිරීම විශේෂයෙන් අදහස් කෙරේ.

**සද්ධෙය්‍ය වචසා උපාසිකා:-**

සෝවාන් ආදී මගඵල ලැබූ ආර්ය ශ්‍රාවිකාවක් අදහස් කෙරේ.

**පටිජානමානො:**

ඒ හුන් භික්ෂුව ඒ චෝදනාව ඒ ආකාරයෙන් පිළිගන්නේ නම් පමණක් ක්‍රියා කළ යුතු බව මෙයින් අදහස් කෙරේ.

**නිදානය:-**

බුදුරදුන් සැවැත් නුවර දෙව්රම්හි වැඩ වෙසෙන සමයෙහි උදායි තෙර උපස්ථායක කුල හා ඉතා කුලුපග ව වෙසේ. වරක් උන්වහන්සේගේ කුලුපග පවුලකින් කුමරියක් එබඳු වූ ම පවුලකට පාවා දෙන ලදි. ඒ කුමරිය සොයා ගෙන එහි ගිය උන්වහන්සේ එහි ඇතුළු කාමරයක ඇය සිටි තැනට ම ගොස් අසුනෙක වාඩි වී ධර්ම කථාවක යෙදුණේ ය. එම ගෙදර විශාඛාවට ද ගරු කරන තැනකි. ඒ අවස්ථාවේ ඔවුන්ගේ ඇරයුම් පරිදි ඇය ද එහි ආවා ය. එහි දී උදායි තෙරුන්ගේ මේ ක්‍රියාව දුටු උපාසිකාව උන්වහන්සේට එහි වරද ගැන කරුණු කීවා ය. එය උන්වහන්සේ නොපිළිගත්හ. පසුව මෙය විශාඛාවගෙන් දැනගත් භික්ෂූහු බුදුරදුන්ට දැන්වූහ. බුදුහු ඒ නිමිති කොට සිකපදය පැණවූහ.

**දෙවන අනියත ශික්ෂා පදය**

> න හෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති නාලං කම්මනියං අලඤ්ච ඛො හොති මාතුගාමං දුට්ඨුල්ලාහි වාචාහි ඔභාසිතුං, යො පන භික්ඛු තථාරූපෙ ආසනෙ මාතුගාමෙන සද්ධිං එකො එකාය රහො නිසජ්ජං කප්පෙය්‍ය තමෙනං සද්ධෙය්‍ය වචසා උපාසිකා දිස්වා ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන වදෙය්‍ය සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා. නිසජ්ජං භික්ඛු පටිජානමානො ද්වින්නං ධම්මානං අඤ්ඤතරෙන කාරෙතබ්බො සංඝාදිසෙසෙන වා පාචිත්තියෙන වා යෙන වා සා සද්ධෙය්‍ය වචසා උපාසිකා වදෙය්‍ය තෙන සො භික්ඛු කාරෙතබ්බො අයම්පි ධම්මො අනියතො.

**පදාර්ථය:-**

ආසනය ආවරණය වූවක් නොවේ. මෙවුන්දම් ක්‍රියාවකට සුදුසු ද නොවේ. එහෙත් ස්ත්‍රියක් හා අසැබි වදනින් කථා කිරීමට ප්‍රමාණවත් වෙයි. යම් භික්ෂුවක් එබඳු අසුනක හුදෙකලා ව රහසිගත ව හිඳින්නේ නම් එය ඇදහිය යුතු බස් ඇති උපාසිකාවක දැක සංඝාදිසෙස හෝ පාචිත්තිය යන ද්විධ ආපත්තීන් ගෙන් එකකින් චෝදනා කරයි ද භික්ෂුව ද එම හිඳීම පිළිගන්නේ නම් සංඝාදිසේස, පාචිත්තිය යන ඇවැත් අතුරෙන් ඒ ඇදහිය යුතු වචන ඇති උපාසිකාව චෝදනා කරන ඇවතකින් එම භික්ෂුවට ක්‍රියා කරවිය යුතු ය. මෙය ද අනියත ආපත්තියකි.

**විවරණය:-**

**'නහෙව ඛො පන පටිච්ඡන්නං ආසනං හොති'**

මෙය පාරාජිකාවකින් චෝදනා කිරීමට තරම් ආවරණය වූවක් නොවේ. එබැවින් සෙසු ආපත්තිවලින් පමණක් චෝදනා කිරීමට ඉඩ ඇත. සංඝාදිසේසයෙන් වුව ද දුට්ඨුල්ලාපත්තියකට පමණි, ඉඩ ඇත්තේ.

**නිදාන කතාව:-**

බුදුරදුන් සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වෙසෙන සමයකි. පළමු අනියත සික පදය පැණවීමෙන් පසු ව එම නිවසට ම ගිය උදායී තෙරණුවෝ ආවරණය නොවූ එහෙත් හුදෙකලා තැනක හිඳ ඒ කුමරිය සමග ධර්ම කතා පැවැත්වී ය. එහි ද සපැමිණි විශාඛාව දැක කරුණු කීවා ය. උන්වහන්සේ නොපිළිගත්හ. මෙය බුදුරදුන්ට සැළවීමෙන් පසු මෙම සිකපදය පදවන ලදී.

**සැ.යු.**

**මේ අනියත සිකපද දෙකේ ද, උපාසිකාවගේ සාක්ෂිය වැදගත් ය. ඇය ඇදහිය යුතු කෙනෙකු විය යුතු ය. එසේම වාඩි වී සිටිනු මිස පළමු සික පදයේ දී පාරාජිකාදියට අදාළව හෝ දෙවැන්නේ සංඝාදිසේසාදියට අදාළ ව හෝ කරුණු ඉදිරිපත්ව නැත. චෝදනාව කෙරෙන්නේ සිටින ආකාරයට අනුව ය. එබැවින් මෙය සැකය මත කෙරෙන චෝදනාවකි. මේ අනුව සාක්ෂිකාරිය කියන ආපත්තියෙන් චෝදනා කළ හැක්කේ චූදිත භික්ෂූන් වහන්සේ එය පිළිගන්නේ නම් පමණකි. මේ නිසා මේ දෙක අනියත වෙයි.**